# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,636 – 2010 ජනවාරි මස 08 වැනි සිකුරාදා – 2010.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (II අ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු – ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දෙමළ භාෂාවෙන්, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති දෙමළ භාෂාවෙන් උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 පෙබරවාරි මස 15 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 දෙසැම්බර් මස 16 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | කල්මුණ | අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණ නගර කොට්ඨාසයේ උප්පැන්න, මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර. |

01-254

### විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියේ නිලධාරීන් II වන පන්තියට උසස් කිරීමේ විභාගය - 2009**

අංක 1625 දරන 2009 ඔක්තෝබර් මස 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද "රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියේ නිලධාරීන් II වන පන්තියට උසස් කිරීමේ විභාගය - 2009" විභාග නිවේදනයේ 4.0 ඡේදයෙහි දැක්වෙන සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය 2010.01.18 ලෙස සංශෝධනය කරන අතර, එම ඡේදය යටතේ වන සටහනට අමතරව "සටහන 2" ලෙස පහත සටහන ඇතුළත් කරනු ලැබේ.

සටහන 2 - 2010.01.18 වැනි දින වන විට සේවය ස්ථිර කිරීමේ ලිපි ලැබී නොමැති නමුත් III වන පන්තියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර ඇති නිලධාරීන්හට මෙම විභාගය සඳහා අයදුම් කළ හැකි අතර, මෙම විභාග ප්‍රතිඵල මත II වන පන්තියට උසස් කිරීමට සුදුසුකම් ලැබීමට නම් 2010.01.18 දිනට සේවය ස්ථිර කර තිබිය යුතු අතර එදිනට වසර 04ක සක්‍රීය වූ හා එම කාලය තුළ සතුටුදායක වූ සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

02. 07 ඡේදය යටතේ දැක්වෙන අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2010.01.18 ලෙස සංශෝධනය කෙරේ.

03. එම විභාග නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වේ.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2009 දෙසැම්බර් මස 21 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
01-298

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

### ආණ්ඩුවේ නොවන දැන්වීම්

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

එක්සත් රාජධානිය එංගලන්තය N13, 4BS ග්‍රීන් ලේන්, අංක 483 හි පදිංචි (අංක 094328517 දරන බ්‍රිතාන්‍ය ගමන් බලපත්‍රය හිමි) කිම් ලින්ඩා ජෝන් කුලින් යන මා විසින් මඩිහ, පුබුදු මාවත ද රීෆ් හවුස් හි පදිංචි (අංක 039887308 දරන බ්‍රිතාන්‍ය ගමන් බලපත්‍රය හිමි) ඉවාන් මැල්කම් ටේලර් වෙත ප්‍රදානය කරන ලද ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් සහ නීතිඥ බින්දු වික්‍රමසේකර යන අය විසින් ලියා සහතික කරන ලද 2009 අගෝස්තු 09 දාතම හා අංක 535 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් බලරහිත කොට, ශූන්‍ය කොට අවලංගු කරනු ලබන බවත් හා මා වෙනුවෙන් ඔහු විසින් එළඹෙනු ලබන කුමන හෝ ගනුදෙනුවක් සඳහාවත් මා වගකියනු නොලබන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සහ එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

කිම් ලින්ඩා ජෝන් කුලින්.

අංක 483, ග්‍රීන් ලේන්,
ලන්ඩන් N13, 4BS,
එක්සත් රාජධානිය.
01-286

---

**මහජනයා වෙත කෙරෙන දැනුම් දීමයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි ලියාපදිංචි කරන ලද සීමිත වගකීම් සහිත සමාකමක් වන ලියාපදිංචි අංක පීබී 300 දරන කොළඹ 01 ජනාධිපති මාවතේ අංක 69 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති SMB කෙනන්ගා ඉන්වෙස්ට්මන්ට් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය එහි වර්තමාන ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 100,000,070 සිට 25,000,070 දක්වා අඩු කිරීම සුදුසු බව එකී ශ්‍රී ලංකා ජනරජයේ මහජනයා වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ. මෙය ආයතනයේ අතිවිශේෂ මහ සභා රැස්වීමක් මෙම දිනයේ සිට දින 60 කට නොඅඩු දිනයක දී කැඳවීමෙන් සිදුකිරීමට ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කර ඇත. ඒ අනුව අදාළ ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීම සහ ඊට අදාළ මෙම නිවේදනය 2007 අංක 7 දරන සමාගම් පනතේ 59 වගන්තිය ප්‍රකාරව දක්වා ඇත.

යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩුකිරීම අතිවිශේෂ මහ සභා රැස්වීමේ දී කොටස්කරුවන් අනුමත කිරීමෙන් අනතුරුව ආයතනයේ නව ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 25,000,070 වන අතර එය සාමාන්‍ය කොටස් 10,000,007 කින් යුක්ත වනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි.

ඉන්ටර්නැෂනල් කොන්සල්ටන්සි ඇන්ඩ්
කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ආයතනයේ ලේකම්වරු.

2009 දෙසැම්බර් මස 18 වැනි දින.
35/1. ඩික්මන් පාර,
කොළඹ 05.
01-285

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම**

බද්දේගම, බද්දේගම උතුර, "දිල්හානි" හි පදිංචි, අරඹේගොඩ, ලොකුගමගේ තුෂාර ගුණසේකර වන මම, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුල්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ (107 අධිකාරයේ) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත්, මෙයින් දන්වා සිටිමි.

ඒ. එල්. ජී. ටී. ගුණසේකර.

2009 ක්වූ දෙසැම්බර් මස 21 වැනි දින.
"දිල්හානි",
බද්දේගම උතුර,
බද්දේගම.
01-238

**2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනයයි**

සනෙක් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2009 නොවැම්බර් මස 23 වැනි දින ලියාපදිංචි අංක පීවී 70081 යටතේ සංස්ථාපිතයි.
ලියාපදිංචි ලිපිනය : නො. 548/ඒ, හයිලෙවල් පාර, ගොඩගම, හෝමාගම.

මැග්නි කන්සල්ටන්ස් ප්‍රයිවට් ලිමිටඩ්.
ලේකම්.

01-295

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය ප්‍රකාර සී/ස. A. D. N. ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම, සිය සමාගම් නාමය 2009 නොවැම්බර් 16 දා සිට සී/ස. A. P. N. ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම යනුවෙන් වෙනස්කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගම් අංකය : පී.වී. 63368
සමාගම ලියාපදිංචි කාර්යාලය : 195/1එෆ්, කොස්ගහවත්ත මාවත, මාලපල්ල, පන්නිපිටිය.

සී/ස. A. P. N. ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම,
අධ්‍යක්ෂ මණ්ඩලය.

01-248

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම**

උයන්වත්ත, අඹතැන්න අංක 1/19 පදිංචි කුලතුංග මුදියන්සේලාගේ රංජිත් කුලතුංග වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජනවාරි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජනවාරි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

වැනි වගන්තිය ප්‍රකාර මෙතැන් සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

කේ. ඇම්. ආර්. කුලතුංග.

අංක 1/19, උයන්වත්ත,
අඹතැන්න.
01-241

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

අළුත්ගම, කළුවාමෝදර, වඩුමුල්ල පාර, අංක 56 දරන ස්ථානයේ පදිංචි, සිංහාර සුදන්තා ප්‍රේමලාල් සිල්වා වන මම, කළුතර දිස්ත්‍රික්කයේ අළුත්ගම පදිංචි අම්බලන්ගොඩගේ ගාමිණී ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් වර්ෂ 2004.02.14 වැනි දින ලියා සහතික කරන ලද අංක 1377 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් අළුත්ගම, කළුවාමෝදර, ශ්‍රී සීලානන්ද පාරේ පදිංචි සිංහාර සුනිල් ධර්මරත්න යන අය වෙත පවරන ලද එකී ඇටෝර්නි බලය වර්ෂ 2009 ක්වූ දෙසැම්බර් මස 21 දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටමත් මෙයින් දැනුම් දෙමි.

සිංහාර සුදන්තා ප්‍රේමලාල් සිල්වා.

2009 දෙසැම්බර් මස 21 වැනි දින.
01-354

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

වැලිවේරිය ඇටිකෙහෙල්ගල්ල අංක 176/3 යන ස්ථානයේ පදිංචි මාබිම හේවගේ හේමාල් වීරසිංහ වන මම, ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරය) 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනයාටත් මෙයින් දන්වා සිටිමි.

එම්. එච්. එච්. වීරසිංහ.

2009 ක්වූ දෙසැම්බර් මස 22 වැනි දින දීය.
01-313

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

වාද්දුව, මහා විහාර පාර, අංක 241 හි පදිංචි පැටිකිරි ආරච්චිල්ලාගේ ජයසිංහ වන මම, කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වගන්තිය ප්‍රකාර මෙතැන් සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

පී. ඒ. ජයසිංහ.

241, මහා විහාර පාර,
වාද්දුව.
01-350

---

### වගකීම් සීමාසහිත සමාගමක් පිහිටුවීම සඳහා වූ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ අංක 9(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : අර්වින් වර්ණසූරිය ඇන්ඩ් ආර්. ඒ. ප්‍රනාන්දු හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 69119
ලියාපදිංචි කාර්යාලය : අංක 105/1, 1/1, දුටුගැමුණු වීදිය, කොහුවල.

සමාගම් ලේකම්.

01-283

---

### වගකීම් සීමාසහිත සමාගමක් පිහිටුවීම සඳහා වූ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ අංක 9(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : බී. ඒ. බිස්නස් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 60687
ලියාපදිංචි කාර්යාලය : අංක 94, ඉදිරිස් මවුලාන පාර, අක්කරපත්තු -1

සමාගම් ලේකම්.

01-282

---

### විශේෂ ඇටෝර්නි බලය අවලංගු කිරීම

හාරිස්පත්තුව, මැදවල, පැනහැටිපොල, නො. 265 හි පදිංචි හේරත් මුදියන්සේලාගේ අබේරත්න බණ්ඩා වන මා විසින් එම ලිපිනයෙහිම පදිංචි පද්මා කුමාරි සමරකෝන් යන අයට 2007.11.12 වැනි දින වත්සලා කුමාරි හේරත් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 816 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කොට බලරහිත කරන ලබ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවටත්, පොදු මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

එච්. එම්. අබේරත්න බණ්ඩා.

2009 දෙසැම්බර් මස 24වැනි දින.
01-367

---

### දැන්වීමයි

මාතර, 55/2, කුමාරදාස මාවත, පදිංචි ගුණසේන පතිරණගේ සමරසිංහ වන මම, මාතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරියේ නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

ජී. පී. සමරසිංහ.

2009 ක්වූ දෙසැම්බර් මස 23 වැනි දින,
මාතර.
01-329

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

වින්ක් ඇඩ්වර්ටයිසින් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 334(2) වගන්තිය යටතේ පවත්වනු ලබන ණය හිමියන්ගේ රැස්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 334(2) වැනි වගන්තිය යටතේ වින්ක් ඇඩ්වර්ටයිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි (මින් පසු සමාගම යනුවෙන් හඳුන්වනු ලබන) සමාගම් පනතේ 334(3) (ආ) වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ණය හිමියන්ගේ රැස්වීමක් වර්ෂ 2010 ක්වූ ජනවාරි මස 22 වැනි දින පෙ. ව. 10.15 ට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත්කරනු ලබන ක්ලීටස් මල්ලවාරච්චි මහතාගේ සභාපතිත්වයෙන් යුතුව, අංක 110, නොරිස් කැනල් මාවත, කොළඹ 10, යන ස්ථානයේ පිහිටි ඩිස්ටිලරීස් කොම්පැණි ඔෆ් ශ්‍රී ලංකා (පී. එල්. සී) අධ්‍යක්ෂ මණ්ඩල කාර්යාලයේ දී පහත අරමුණු සඳහා පැවැත්වේ.

න්‍යාය පත්‍රය

1. සමාගමේ කටයුතුවල වර්තමාන තත්වය, සමාගමේ ණය හිමියන්ගේ නාම ලේඛනය සහ ඔවුන්ගේ හිමිකම්පෑම් පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සකසනු ලබන වර්තාවක් ඉදිරිපත් කිරීමට.
2. 2007 අංක 7 දරන සමාගම් පනතේ 335 වැනි වගන්තිය යටතේ සමාගමේ ගණන් බේරා වසා දැමීම සහ වත්කම් බෙදාහැරීම සඳහා ඈවරකරුවකු/ඈවරකරුවන් පත් කිරීම.
3. 2007 අංක 7 දරන සමාගම් පනතේ 336 වැනි වගන්තිය සහ අනෙකුත් ප්‍රතිපාදන යටතේ ගණන් බේරා වසා දැමීමේ කාර්යය සඳහා සුදුසු යැයි සලකණු ලබන්නේ නම්, පස් දෙනෙකුට නොවැඩි ගණනකින් යුත් පරීක්ෂණ කමිටුවක් පත් කිරීමට.
4. 2007 අංක 7 දරන සමාගම් පනතේ 337(1) වැනි වගන්තිය යටතේ ඈවරකරුගේ පාරිශ්‍රමිකය තීරණය කිරීම සඳහා (ඉහත දක්වන ලද පරීක්ෂණ කමිටුව පත්කරනු නොලැබුවහොත් පමණක්)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ෆිනෑන්ෂල් සර්විසස් ඇන්ඩ් කොමර්ෂල් ඒජන්සීස් ප්‍රයිවට් ලිමිටඩ්.
(වින්ක් ඇඩ්වර්ටයිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සමාගම් ලේකම්වරු)

**සටහන**.- ණය හිමියා යන්නට (ණයකර හිමියකුද ඇතුළත්ව) සමාගම් පනතේ 138(1)(b) වගන්තිය යටතේ ණය හිමියන්ගේ රැස්වීමකට සහභාගිවීමට සහ ඡන්දය දීමට අයිතිය ඇති අයකු සහ තවද ණය හිමියා සමාගමක් වන විටදී ඒ සමාගම නියෝජනය කිරීම සඳහා ඒ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ සම්මත කරන ලද යෝජනා සම්මතයක් මගින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ හෝ ඒ යටතේ පනවනු ලැබූ වෙනත් නීතියක් යටතේ හෝ ණයකර පත්‍රිකාවක හෝ බාර ඔප්පුවක ප්‍රතිපාදනයක් යටත් පවත්වනු ලබන ණය හිමියන්ගේ රැස්වීමකට සහභාගිවීමට බලය ලද පුද්ගලයකුට ඇතුළත් වේ.

01-373

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ජනරජයේ අතුරුගිරිය, ඔරුවල අබේතිස්ස මාවත අංක 183/ඩී දරන නිවසේ පදිංචි අබේසිරි නාරායන දිල්රුක්ෂි වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. සිරන්ත විසින් සහතික කරන ලද වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 10 වැනි දිනැති අංක 2323 දරන ඇටෝර්නි බලයෙන් අතුරුගිරිය, පත්තිනියාවත්ත, 114/ජී දරන නිවසේ පදිංචි පාඩිකංකානමලාගේ රෝහිත නීල් වීරසූරිය වෙත ප්‍රදානය කරන්නට යෙදුණු ඇටෝර්නි බලය මා විසින් 2009 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කොට ඇති බවත් එකී පාඩිකංකානමලාගේ රෝහිත නීල් වීරසූරිය විසින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරන්නට යෙදුණු කිසිදු ක්‍රියාවක් හෝ ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් මා මින් මතු වග නොකියන බවත් මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

අබේසිරි නාරායන මංගලා දිල්රුක්ෂි.

2009 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින දී ය.
01-297

---

### විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 00300 බගතලේ පාර අංක 14 හි පදිංචි ධිරන් ජයිකිෂාන් නිර්මලලිංගම් (ජාතික හැඳුනුම්පත් අංක 670013910 V ) යන අයව මාගේ ඇටෝර්නි බලකරු ලෙස බලකරනු ලැබූ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සන්ජේ තවනේසන් විසින් වර්ෂ 2009 ක් වූ ජූලි මස 20 දින ලියා සහතික
කරන ලද අංක 771 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙතැන් පටන් ශූන්‍ය හා බලරහිත හා නීතිය ඉදිරියේ බලාත්මක කළ නොහැකි ලේඛනයක් බවත් කොළඹ 00700 බාන්ස් පෙදෙස අංක 79 හි පදිංචි සරෝජිනී රත්නරාජ් නවරත්නම් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනයාට මෙයින් දැනුම් දෙමි.

සරෝජිනී රත්නරාජ් නවරත්නම්.

වර්ෂ 2009 ක් වූ දෙසැම්බර් මස 16 වැනි දින දී ය.
01-300

---

### විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දික්වැල්ල, මහවීදිය, අංක 48 (දැනට, 109-5235, Finch Avenue East, Scarborough, ontario, MIS 5x3, Canada) පදිංචි උපාලි ගුණරත්න වන මා විසින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් උපාලි සරත්චන්ද්‍ර මහතා ලවා අංක 11766 සහ 2007.06.15 දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් එකී බලපත්‍රයේ සඳහන් කාර්යයන් ඇටෝර්නි අධිපති වන මා නමින් සහ මා වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම පිණිස මාගේ ඇටෝර්නි බලකරු හැටියට දෙවිනුවර, ග්‍රාමීය රෝහල පාර "දයාවාස" හි පදිංචි ගාර්දිය වර්ණකුල සමිතපාල යන අයට දෙන ලද බලය මෙයින් අවලංගු කරන අතර, එකී ගාර්දිය වර්ණකුල සමිතපාල යන අය විසින් මා නමින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මින් ඉදිරියට මා වග නොකියන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සියලු දෙනාටත් මෙයින් දැනුම් දෙමි.
01-247

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සෙලාන් බැංකුව පී.එල්.සී. - අත්තිඩිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ ගල්කිස්ස පදිංචි මදසාමි ජීවරත්නම් යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කෙසෙල්වත්ත පිහිටි කළුතර කොට්ඨාසයේ මිනුම්පති වෙනුවට මිනුම් අධිකාරී ජේ. පී. එන්. එම්. ද සිල්වා විසින් සාදන ලද 1989.10.20 දිනැති අංක 2434 දරන බෙදුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 85 ලකුණු කළ (මූලික සැලසුම් අංක 1387 හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තිස් හයයි දශම හතයි හයක් (අ.0, රූ.0, පර්. 36.76) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි නවයයි තුනක් (හෙක්ටයාර 0.093) ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2010 ජනවාරි මස 26 වැනි දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණු ලැබේ.

*දේපළට පිවිසීම*.- පානදුර, කෙසෙල්වත්ත මංසන්ධියේ සිට දිග්ගල ජැටිය පාරේ කි. මී. 2 ක් පමණ ගිය විට වම්පසට ඇති මහකින්ගම ආදර්ශ ගම්මානයට යන පාරට හැරී තවත් මීටර් 200 ක් පමණ ඉදිරියට ගිය විට පාරේ වම්පස පිහිටා ඇති ප්‍රජාශාලාව මැදින් ඇති පාරේ මීටර් 50 ක් පමණ ගිය විට පාරේ වම්පස අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම*.- *රජයේ ගැසට් පත්‍රයේ* 2009.10.30 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2009.10.19 වැනි දින ද නිනකුරල් පුවත්පතේ 2009.10.21 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පී.එල්.සී. වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011 2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න *(සාම විනිසුරු)*,
බලයලත් වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත,
කොලොන්නාව.
දු. ක. 011-3068185, 011-2572940.
01-317

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/05/5841/කේවයි3/958.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.10.16 *ගැසට් පත්‍රයේ* සහ 2009.11.16 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබූවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.15 වැනි දින පස්වරු 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ, මැදසිය පත්තුවේ උකුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ තවලංකොය පිහිටි ෆයිරෝස්හිල්වත්ත (බංගලාව කොටස) ඉඩමට 2003.03.28 දින බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. පී. ජී. ගුණතිලක විසින් බෙදා වෙන්කර සකසන ලද අංක 1239 මිනුම් පිඹුරට අනුව කැබලි අංක 01 ලෙස සඳහන් (මෙය 1983.10.18 දින අංක 1944 මිනුම් පිඹුරට අනුව බලයලත් මිනින්දෝරු කේ. එස්. සමරසිංහ විසින් නැවත බෙදා වෙන් කර සකසන ලද කැබලි අංක 1 බිම් කොටස) ප්‍රමාණයෙන් අක්.0 රූඩ්.0 පර්. 0ක් වූ බිම් කොටස.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 534/189 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
*වැඩ බලන සාමාන්‍යාධිකාරි.*

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.
01-375/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/17/4774/කේවයි3/654.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.08.26 *ගැසට් පත්‍රයේ* සහ 2005.10.10 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබූවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.10 වැනි දින පස්වරු 1.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රාදේශීය සභා සීමාවේ, පලුගස්වැව පිහිටි ගොඩඉඩම නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක විසින් සකසන ලද 2000.08.14 දිනැති හා අංක 4931 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන අක්. 0, රූඩ්.3, පර්. 5 ක්වූ බෙදා වෙන්කරන ලද බිම් කොටස හා ඊට අයිති සියලු දේත් සමඟ වේ.

මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්පත් අංක එල්. ඩී. ඕ. 207/205 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.
01-375/8

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/05/4862/කේඑන්1/242.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.08.26 *ගැසට් පත්‍රයේ* සහ 2005.10.11 දිණමිණ පත්‍රයේ පළ කරනු ලැබූවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.15 වැනි දින පෙරවරු 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගම්මඩුව, කලුගල්තැන්නහි පිහිටි කලුගල්තැන්න නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. එම්. ජයසේකර විසින් සැකසුණු 2000.10.21 දින හා අංක 9575 දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 2, පර්. 17 ක් වූ බෙදා වෙන්කරන ලද බිම් කොටස හා ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලුම දේත් සමඟ වේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 226/138 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
*වැඩ බලන සාමාන්‍යාධිකාරි.*

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
01-375/7

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 06ඒ/25163/වයි6/886.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.10.20 *ගැසට් පත්‍රයේ* සහ 2006.12.18 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබූවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.20 වැනි දින පෙරවරු 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ බටුවිට පිහිටි මහවිතානගෙවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඒ. සේනානායක විසින් සකසන ලද 1987 ජුනි මස 13, 19 සහ 20 දින සහ අංක 295 දරන පිඹුරේ කැබලි අංක 08 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0 රූ.0 පර්.30.2 ක්වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තව ද එකී දේපළ දැනට ඩී. එච්. ඇතුලත්මුදලි මිනින්දෝරුතැනගේ 1993.07.23 වෙනි දින හා අංක 2714/ඒ දරන පිඹුරේ දක්වා ඇත.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 111/194 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
01-375/9

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 06/40896/එල්6/910.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.01.16 *ගැසට් පත්‍රයේ* සහ 2004.10.02 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබූවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.20 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ කැකුලන්දොල පිහිටි පිඹුරවත්ත (ස්වර්ණරේඛාගම) නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් 1997.12.26 දින සකසන ලද අංක 260 දරන පිඹුරේ කැබලි අංක 95 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ.0, රූ.0, පර්.19.93 ක්වූ බිම් කොටස වේ.

තව ද පිඹුරු අංක 260 මතින් දක්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 292/10 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 14 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
01-375/10

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 01/42999/සීඩී6/821.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.05.13 *ගැසට් පත්‍රයේ* සහ 2005.07.05 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබූවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.18 වැනි දින පස්වරු 1.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කොරතොට ගමේ මිල්ලගහවත්ත දැන් ඉසුරුසිරි උයන නමින් හඳුන්වන ඉඩමේ 1993.09.18 සහ 23 දින බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සකසන ලද සහ 2001.07.17 දින සංශෝධනය කරන ලද 1253 දරන පිඹුරේ කැබලි අංක 22 ලෙසින් බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ.0, රූ.0, පර්.10 ක්වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුදේත් සමග වේ.

තව ද එකී 1253 දරන පිඹුරේ කැබලි අංක 13, 44, 45 සහ 46 මතින් වූ මාර්ග අයිතියද වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 1069/105 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
01-374

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි.

ණය අංකය :- කේ/05/5546/කේවයි3/821.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.07.15 *ගැසට් පත්‍රයේ* සහ 2005.08.22 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.15 වැනි දින පස්වරු 3.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ උඩතැන්න පිහිටි උඩතැන්නවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඕ. පෙරේරා විසින් සැකසුණු 2002.09.12 දින හා අංක 2083 දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 0, පර්. 19.2 ක් වූ බෙදා වෙන්කරන ලද බිම් කොටස හා ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ.

තව ද ඉහත අංක 2083 පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති බිම් කොටස කේ. ඕ. පෙරේරා මිනින්දෝරුතැනගේ 1997.06.01 දිනැති හා අංක 1148 දරන පිඹුරේ කැබලි අංක 5 හි නැවත මිනුමක් වන අතර ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 0, පර්. 19.2 කි.

තව ද එකී අංක 1148 දරන පිඹුරේ කැබලි අංක 07 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 460/270, 271 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 24 වැනි දින.
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
01-375/6

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/5/3451/ඩී5/746, 5/76043/කේවයි3/118

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.01.16 *ගැසට් පත්‍රයේ* සහ 2009.03.30 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.16 වැනි දින පස්වරු 02.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කන්දපල්ල කෝරලයේ මාතලේ උතුර සියඹලාවැව පිහිටි වැලිකඩයාය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. සිරිපාල විසින් මැන සකසන ලද 1998.05.05 වැනි දින අංක 106 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 01, පර්. 28 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස.

මෙම ඉඩම් කොටස මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක ඩී 385/64 හි ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන, (මිය)
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 24 වැනි දින.
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
01-375/5

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/71974/වයි18/929.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.11.11 ගැසට් පත්‍රයේ සහ 2006.01.23 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.16 වැනි දින පෙරවරු 11.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ උහුමිය මොරගොල්ල සහ පාම්බේ ග්‍රාමයන්හි පිහිටි ක්ලෝවිස් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. ඩී. එස්. ගුණරත්න විසින් සකසන ලද 1997.10.30 දිනැති හා අංක 92/97 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 7ඒ ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 01, රූ. 0, පර්. 0 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

මෙම ඉඩම් කොටස කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්පත් අංක එෆ් 1166/128 හි ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන, (මිය.)
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 24 වැනි දින.
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
01-375/4

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ4/2069/කේවයි2/301.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2000.04.14 *ගැසට් පත්‍රයේ* සහ 2000.08.28 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මීගමුව, ප්‍රනාන්දු ඇවනිව්, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2010.02.13 වැනි දින පෙරවරු 11.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය සභා සීමාව තුල අඹගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ටී. අමරපාල විසින් සැකසුණු 1992.02.10 වැනි දින හා අංක 45 දරන පිඹුරේ ඕවිටගෙදරවත්ත නමැති ඉඩමේ ප්‍රමාණයෙන් අ. 0, රූ. 01, පර්. 35.63 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

මෙම ඉඩම් කොටස ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක බී 36/141 යටතේ ලියාපදිංචි වී ඇත.

අයි. විමලසේන, (මිය.)
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 24 වැනි දින.
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
01-375/2

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරුනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/13/5516/කේඑන්1/330

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.01.02 *ගැසට් පත්‍රයේ* සහ 2009.10.05 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2010.02.13 වැනි දින පස්වරු 2.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත සඳහන් උපලේඛනය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිස්පනේ කෝරලේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිස්පනේ කෝරලේ අංක 462බී ගොඩමඩිත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තිස්පනේ උඩුගම්මැද්ද ග්‍රාමයේ පිහිටි තිස්පනේ වත්ත කටුගොල්ල නමැති ඉඩමේ රජයේ මිනුම්පති විසින් මැන සකසන ලද 1989.10.31 දිනැති හා අංක පිපිනු/1270 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 146 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 1.10 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස වේ.

මෙම ඉඩම් කොටස නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක කො/166/558/2001 හි ලියාපදිංචි කොට ඇත.

තවද එකී මිනුම් පිඹුරේ පිහිටි සියලු මාර්ග අයිතීන් හා ඒ මත ඇති සියලු දේත් සමඟ වේ.

අයි. විමලසේන (මිය),
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 24 වැනි දින.
අංක 269, ගාලුපාර,
කොළඹ 03.
01-375/3

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනත 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

මීගමුව, ඒත්තුකාල, අංක 133/1, හි රාණි සමූහ ව්‍යාපාරයේ ණය වගකීම් සඳහා, බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, (දැනට මීගමුව මහ නගර සභා සීමාව තුළ) දූනගහපත්තුවේ, ඒත්තුකාලෙහි පිහිටි මට්ටමක්කුලියේපල්ලම නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් සාදනලද 1990.09.07 දිනැති අංක 9211 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා ඇති උකස් කරන ලද දේපළ.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 නොවැම්බර් මස 06 දිනැති අංක 1627 දරන ගැසට් පත්‍රයේ හා 2009.10.26 දිනැති දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2010 පෙබරවාරි මස 12 වැනි දින ප. ව. 3.00ට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි පදිංචි ප්‍රසිද්ධ පුරෝගාමී වරලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, ඒත්තුකාලෙහි පිහිටි මට්ටක්කුලියේපල්ලම නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එල්. කෲස් දාබරේරා විසින් සාදන ලද 1990.10.27 දිනැති අංක 5573/1990 දරන පිඹුරෙහි ලොට් බී1 ලෙස දක්වා සීමා නිර්නය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට පාර ද, නැගෙනහිරට ඕසීස් බීච් හොටෙල් හි ලොට් බී2ද, දකුණට එන්. ජේ. කුරේගේ ලොට් සී ද, බස්නාහිරට පාර (මහා මාර්ගය) ද, මායිම්ව පර්චස් විසිපහක (අ. 0, රූ. 0, පර්. 25) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

එකී බිම් කැබැල්ල පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, (දැනට මීගමුව මහ නගර සභා සීමාව තුළ) දූනගහපත්තුවේ, ඒත්තුකාලෙහි පිහිටි මට්ටමක්කුලියේපල්ලම නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ල්. බී. නානායක්කාර විසින් සාදනලද 1990.09.07 දිනැති අංක 9211 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා නිරූපනය කර ඇති බෙදූ කොටස එනම්, එකී ලොට් 1 උතුරට අඩි 10ක් පළල පාරද, නැගෙනහිරට අංක 1631 දරන පිඹුරෙහි ලොට් බී2 ද, දකුණට ලොට් සී ද, බස්නාහිරට පාර - මීගමුවේ සිට කොච්චිකඩේ දක්වා මහා මාර්ගය ද, මායිම්ව පර්චස් විසිහතරයි දශම හතරක (අ. 0, රූ. 0, පර්. 24.4) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර, පෝරුතොට පාරේ, වරිපනම් අංක 116 සහ 116/1 දරන එහි ඇති ගොඩනැගිලි, වගාවන් සහ සියලු දේද වේ.

ඒ සමගම මෙයට උතුරු දෙසට ඇති අඩි 10ක් පළල පාර භාවිතා කිරීමට අයිතියද ඇති අතර, මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 690/275හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. තිලකරත්න බණ්ඩා,
ප්‍රධාන කළමනාකරු.
(අයකරගැනීම් - ආයතනික)

ලංකා බැංකුව,
අයකරගැනීමේ ඒකකය.
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.
01-361

---

**ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීමයි.

(1) වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වැඋඩ විල්ලි හත්පත්තුවේ, ගන් දහය කෝරළේ මාවතගම, මිතැන්වල, පල්ලේගම, රඹත්ත සහ ඔලියමුල්ල යන ගම්වල පිහිටි සීපීල්ඩ් යන ඉඩමේ බලයලත් මානක ඩබ්ලිව්. ඩී. බී. රෙජිනෝල්ඩ් විසින් 1969 ජූලි මස 05 වැනි දින සාදන ලද අංක 1410 දරන පිඹුරේ ලොට් 9 දරන ඉඩම් නැවත මැනීමකට අනුව අංක 2004/59 හා 2004 මාර්තු 08 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 01 දරන ඉඩම් කොටසේ ප්‍රමාණය පර්චස් විසිහතරක් (අ. 0, රූ. 0, ප. 24) හෝ හෙක්ටයාර් (0.0607) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියලුදේත් සමග.

(2) වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වැඋඩවිල්ලි හත් පත්තුවේ, ගන්දහය කෝරළේ, මදව, උඩුමුල්ල, පිලැස්ස සහ හේනපොල යන ග්‍රාමයන්හි පිහිටි ඩේසිමවුන්ට් එස්ටේට් කියන ඉඩමේ බලයලත් මානක ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් 1997 ඔක්තෝබර් මස සාදන ලද අංක 171/97 දරන පිඹුරේ බෙදා වෙන්කරන ලද ලොට් 33 දරන කොටසේ ප්‍රමාණය (අ. 0, රූ. 0, ප. 15) හෝ (හෙක්ටයාර් 0.0379), විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියලු දේත් සමඟ වේ.

(3) ඉහත කී මදව, උඩුමුල්ල, පිලැස්ස සහ හේනපොල යන ගම්වල පිහිටි ඩේසි මවුන්ට් එස්ටේට් කියන ඉඩමේ බලයලත් මානක ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද අංක 171/97 හා 1997 ඔක්තෝබර් දරන පිඹුර පරිදි බෙදා වෙන්කරන ලද ලොට් 34 දරන බිම් කට්ටියේ ප්‍රමාණය (අ. 0, රූ. 0, ප. 15) හෝ (0.0379 හෙක්ටයාර්) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියලුදේත් සමඟ වේ.

(4) ඉහත කී මදව, උඩුමුල්ල, පිලැස්ස සහ හේනපොල යන ගම්වල පිහිටි ඩේසි මවුන්ට් එස්ටේට් කියන ඉඩමේ බලයලත් මානක ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් 1997 ඔක්තෝබර් මස සාදන ලද අංක 171/97 දරන පිඹුර පරිදි බෙදා වෙන්කරන ලද ලොට් 36 දරන බිම් කට්ටියේ ප්‍රමාණය (අ. 0, රූ. 0, ප. 12) හෝ (හෙක්ටයාර් 0.0304) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියලුදේත් සමඟ වේ. කියෝඩෝ ලංකා එන්ටර්ප්‍රයිසස් යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ නුගේගොඩ හවුල් වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අකුරන්ගේ ලයනල් ජයසිංහ සහ දේවිකා මල්කාන්ති රන්කොත්ගෙදර (විවාහයට පෙර ජයසිංහ) යන අය විසින් ණයකරුවන් හැටියටද, ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුවට උකස් කරන ලද පහත විස්තර කරන ලද දේපළ ලොට් 1 දරන ඉඩම (අ. 0, රූ. 0, ප. 24) (හෙක්ටයාර් 0.0607) 2010 පෙබරවාරි මස 01 වැනි දින පෙ. ව. 11.00 ට ද, ලොට් 33 දරන ඉඩම (අ. 0, රූ. 0, ප. 15) (හෙක්ටයාර් 0.0379), ලොට් 34 දරන ඉඩම (අ. 0, රූ. 0, ප. 15) (හෙක්ටයාර් 0.0379), ලොට් 36 දරන ඉඩම (අ. 0, රූ. 0, ප. 12) (හෙක්ටයාර් 0.0304) ලොට් 33, 34,36 දරන ඉඩම් 2010 පෙබරවාරි මස 01 වැනි දින ප. ව. 12.30ටද, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය* : වෙන්දේසිකරු විසින් වෙන්දේසිය නතරකළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%)
2. පළාත්සභා ගාස්තුව සියයට එකක් (01%)
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැනුම් මිලෙන් සියයට (2 1/2%)
4. නොතාරිස් ගාස්තුව රු. 2,000
5. ලිපිකරු හා සෝෂක ගෙවීම් රු. 500
6. ප්‍රචාරක වියදම් සඳහා වැයකරන ලද මුළු මුදල
7. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් නිලධාරින් විසින් නියෝග කරන ලද පරිදි ජී. එස්. ටී. 12.5% සමඟ ව්‍යවස්ථාපිත බද්ද, රාජකාරි බදු සහ වෙනත් ගෙවීම් නිකුත්කළ දින සිට දින 30ක් තුළදී ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුවේ, 2371371 ට අමතන්න.

එල්. බී. සේනානායක - සාම විනිසුරු,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් : 011-2445393

01-351

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.- නාරම්මල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක එම්. ගුණසේකර විසින් 1998 අගෝස්තු මස 09 වැනි දින සාදන ලද අංක 1805 දරන පිඹුර පරිදි වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, උඩුකහ උතුර කෝරලේ, ලිනියාවත්ත පිහිටි ගල්වන්ගියවත්ත කියන බෙදා වෙන්කරන ලද ලොට් 1 දරන රූඩ් එකයි පර්චස් හයයි දශම දෙක (අ.0, රූ.1, පර්. 6.2) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලුදේත් සමග වේ.

ජයකොඩි ආරච්චිගේ මහින්ද බන්දුල ජයකොඩි ණයකරු හැටියටද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් හඳුන්වන) ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2010 ක්වූ ජනවාරි මස 27 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.06.20 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, සහ ද අයිලන්ඩ්, ලක්බිම, සහ තිනකරන් පත්‍ර බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2010.01.08 වැනි දින *රජයේ ගැසට්* පත්‍රයද, 2010.01.11 දිවයින සහ ද අයිලන්ඩ් පත්‍ර බලන්න.

*ඉඩමට පිවිසීම.*- නාරම්මල නගරයේ සිට කුලියාපිටිය පාරේ කි. මී. 2 ක් පමණ ගල්වංගුව මංසන්දිය දක්වා ගියවිට එකී දේපළවලට ළඟාවිය හැක. එම දේපළ එම පාර කෙළවරෙහි දෘෂ්‍යමාන වේ.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැනුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
4. නොතාරිස් ගාස්තු රු. 2000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ නාරම්මල ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

අංක : 99,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් : 011-2445393
දුරකථන අංකය : 011-3144520.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී,
අංක : 55,
මීගමු පාර,
නාරම්මල.
දුරකථන අංකය : 037-2249916-7
ෆැක්ස් : 037-2248550.

01-353

---

**සම්පත් බැංකුව පීඑල්සී (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එච්. ටී. දේශප්‍රිය සහ ඒ. ආර්. ලියනගේ
ගිණුම් අංක : 1013 5310 5796

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007 ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තිස් එක් ලක්ෂ හැට දහස් පන්සිය අනූ එකයි ශත අනූ පහක (රු. 3,160,591.95) මුදලද 2007 ජුනි 19 වැනි දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි නම ලක්ෂ විසි දහස් හත්සිය හතලිස් එකයි ශත හැට හතරක (රු. 2,920,741.64) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොලියද, හා ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.08.21 දින රජයේ ගැසට් පත්‍රයේ, 2009.08.06 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2010.02.12 දින ප. ව. 1.30ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවන් තුළ ගංගොඩවිල පරණ කැස්බෑව පාරෙන් හැරී පිහිටි වර්තමානයේ පරණ කැස්බෑව පාර වරිපනම් අංක 117 දරන ඇලබොඩවත්ත යැයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන එච්. ජී. සී. ඩයස් යන අය විසින් සාදන ලද 1973 දෙසැම්බර් 05 දාතම හා අංක 339 සර්වසම ලොට් ඒ හී නැවත මිනුමක් වන) බලයලත් මානක තැන කේ. ජී. ජී. පියසේන යන අය විසින් සාදන ලද 2006 අප්‍රේල් මස 06 දාතම හා අංක 1345 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට පරණ කැස්බෑව පාර වරිපනම් අංක 115/3, දරන පරිශ්‍රයන්, නැගෙනහිරට කැළණිවැලි දුම්රිය මාර්ගය සහ දුම්රිය මාර්ග වෙන්කිරීම, දකුණට කාණුව සහ පිඹුරු අංක 339 හී ලොට් බී සහ බස්නාහිරට ගංගොඩවිල ඇල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොලහයි දශම නමයයි හතක් (ඒ. 0, ආර්. 0, පී. 11.97) විශාල ඉඩම් කොටස සමග ගහකොල, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්. පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 1345 ට අනුවය.

පරණ කැස්බෑව පාරේ සිට එකී පිඹුරු අංක 1345 හී එකී ලොට් ඒ දක්වා අඩි 18 පළල පිවිසුම් මාර්ගය මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

බලයලත් මානක තැන එච්. ජී. සී. ඩයස් යන අය විසින් සාදන ලද 1973 දෙසැම්බර් මස 05 දාතම හා අංක 339 පිඹුරේ සර්වසම ලොට් ඒ හි නැවත මිනුමක් වන ඉහත විස්තර කොට ඇති ලොට් ඒ පහත මැනවින් විස්තර කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ කෝට්ටේ නගර සභා සීමාවන් තුළ ගංගොඩවිල පිහිටි පරණ කැස්බෑව පාර වරිපනම් අංක 115/4 දරන ඇලබොඩවත්ත යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ජී. සී. ඩයස් යන අය විසින් සාදන ලද 1973 දෙසැම්බර් මස 05 දාතම හා අංක 339 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට විජේරත්න විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට කැළණිවැලි දුම්රිය මාර්ග වෙන්කිරීම, දකුණට දිය පාර සහ බස්නාහිරට පරණ ඇල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොලහයි දශම තුනයි අටක් (ඒ0, ආර්. 0, පී.11.38) විශාල ඉඩම් කොටස සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ එකී පිඹුරු අංක 339ට අනුව වෙළුම/පත්ඉරුව එම් 277/212හි ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,
සමාගම් ලේකම්.

01-368

---

**සම්පත් බැංකුව පීඑල්සී (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ගුණවර්ධන කන්ස්ට්‍රක්ෂන්ස්
ගිණුම් අංක : 0056 1000 0233

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 ක් වූ අප්‍රේල් මස 30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට එක් ලක්ෂ අනූ හත් දහස් හාරසිය පනස් නමයයි ශත හතලිස් නමයක (රු. 6,197,459.49) මුදලද 2007 නොවැම්බර් 03 දින සිට බැඳුම්කර අංක 2513 මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් හත් ලක්ෂ එකොළොස් දහස් හාරසිය දහ අටයි ශත තිස් එකක (රු. 5,711,418.31) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොලියද, හා ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.11.20 දින රජයේ ගැසට් පත්‍රයේ, 2009.11.09 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2010.02.03 දින පෙ. ව. 11.30ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පාත හේවාහැට ගංදහය කෝරලේ තල්වත්ත ග්‍රාමයේ පිහිටි පට්ටියකැලේ එස්ටේට් යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන යූ. එච්. බී. කේ. එම්. ටී. අංගම්මන යන අය විසින් සාදන ලද 2003 සැප්තැම්බර් 25 දාතම හා අංක 1135 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 15 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට ලොට් 13 සහ 23, නැගෙනහිරට ලොට් 16, දකුණට ලොට් 18 සහ බස්නාහිරට ලොට් 14 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (අක්. 0, රූඩ්. 0, පර්. 12) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව ඒ 342/216 හි මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී තල්වත්ත ග්‍රාමයේ පිහිටි පට්ටියකැලේ එස්ටේට් යැයි කියනු ලබන ඉඩමට අංක 1135 දරන එකී පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 18 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට ලොට් 15 සහ 16, නැගෙනහිරට ලොට් 17, දකුණට දමයන්ති සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම සහ බස්නාහිරට ලොට් 19 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (අ. 0, රූඩ්. 0, පර්. 12) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව ඒ 342/217 හි මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

(ආ) 2009.02.12 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හැටහත් දහස් දෙසිය හැත්තෑ නමයයි ශත දොළහ (රු. 67,279.12)ක මුදල සහ 2009.02.02 දින සිට රුපියල් හැටතුන් ලක්ෂ හයසිය තිස් නමයයි ශත තිස් එක (රු. 63,639.31) මුදල මත වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොළිය ද,

(ඇ) 2009.02.12 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හැටදෙලක්ෂ පනස් දෙදහස් හාරසිය දොළහයි ශත එක (රු. 62,52,412.01)ක මුදල සහ 2009.02.02 දින සිට රුපියල් හැට ලක්ෂය (රු. 60,00,000) මුදල මත වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොළිය ද,

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 1765 සහ 1820 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් හැටඅට ලක්ෂ හතලිස් හත් දහස් හයසිය විසි නමයයි ශත හතලිස් තුන (රු. 68,47,629.43) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද, අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 9හි පිහිටි එම්. එස්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකාර ශ්‍රියාණි මනම්පේරි වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස ය.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ යටිගහ පත්තුවේ, බටලීය සහ මුරුතවල ගමෙහි පිහිටි (බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 10453 සහ 1991.12.29 දිනැති සැලැස්මේ දැක්වෙන ලොට් 1 දරන ඉඩම් කැබැල්ලේ කොටසක යලි මැනුමක් වන) මුරුතලාව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් මැන සාදන ලද අංක 2190 සහ 2002 මැයි මස 21 වැනි දිනැති සැලැස්මේ ලොට් 1බී වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති, උතුරට : ගම්සභා පාර, නැගෙනහිරට : අංක 10453 සැලැස්මේ ලොට් 1 හි ඉතිරි කොටස, දකුණට : අංක 1192 සැලැස්මේ ලොට් 1ඒ සහ බස්නාහිරට : ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි අක්කර දෙක (අ. 2, රූ. 0, පර්. 0) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ආදී සියලු දේ වේ. මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 315/100හි ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 2 මුල්ගම්පොල පිහිටි (බලයලත් මිනින්දෝරු ටී. පියසේන විසින් මැන සාදන ලද අංක 472/88 සැලැස්මේ ලොට් 2 දරන බිම් කැබැල්ලේ බෙදා වෙන් කරන ලද කොටසක් වන) ප්‍රිම්රෝස් හිල් වත්ත (කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. කේ. බී. මාවලගෙදර විසින් මැන සාදන ලද අංක 922 සහ 1995 දෙසැම්බර් මස 30 දිනැති සහ 1996 ජනවාරි මස 04 සහ 09 දිනයන්හි බෙදා වෙන් කරන ලද ලොට් 2 වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට සහ ඊසාන දිගට : මහනුවර (නගර සභා පාර) නිවාසවල සිට දිවෙන පාර ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස, දකුණට : අංක 922 සැලැස්මේ ලොට් 3 සහ බස්නාහිරට සහ වයඹට : අංක 922 දරන සැලැස්මේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි එකී අංක 922 දරන සැලැස්ම අනුව පර්චස් විසිහතයි දශම පහ (අ. 0. රූ. 0, පර්. 27.5) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, වැවිලි ආදී සියලු දේ වේ. මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 224/276හි ලියාපදිංචි කර ඇත.

එකී 922 සහ 472/88 සැලැස්මයන්හි දක්වා ඇති මාර්ග අයිතීන් සහ සෙසු අයිතීන් ද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
මනෝනීත ආරියනන්ද,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

01-372/1

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් වන ටී. එස්. අයි. වැත්තෑව විසින් ලියා සහතික කරන ලද අංක 3871, 3869, හා 3873 සහ සියල්ලම 2006.12.21 දින දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම්, "අබුතාහීර් ස්ටෝර්ස්"යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස කෑගල්ලේ ව්‍යාපාරය කරගෙන යන කෑගල්ලේ, මඩිගෙ මුහන්දිරම්ලාගේ මොහොමඩ් හනීෆා මොහොමඩ් අබුතාහීර් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 අගෝස්තු 31 දිනට, ඉහත කී අංක 3871, 3869 හා 873 දරන උකස් බැඳුම්කර මත, එකී මඩිගෙ මුහන්දිරම්ලාගේ මොහොමඩ් හනීෆා මොහොමඩ් අබුතාහීර් යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හතලිස් හතර ලක්ෂ හතලිස් තුන්දහස් නවසිය දහහතකුත් ශත අනූපහක (රු. 44,43,917.95) මුදලක් සහ 2009 සැප්තැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස්හත්ලක්ෂයක් (රු. 37,00,000.00) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් 01 යන දිනවලින් ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හතලිස් හතරලක්ෂ හතලිස් තුන්දහස් නවසිය දහහතකුත් ශත අනූපහක (රු.44,43,917.95) මුදලක් සහ 2009 සැප්තැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස්හත්ලක්ෂයක් (රු. 37,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් 01 වන දිනවලින් ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක්(7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 3871, 3869 හා 3873 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 3871 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

01. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරළේ, මාවත පත්තුවේ, කෑගල්ල නගර සභා බල ප්‍රදේශය ඇතුළත වෝඩ් අංක 03 දරන නගර සභා කොට්ඨාසයේ වේවැල්දෙණිය ග්‍රාමයේ පිහිටි කොළඹ පාර, වරිපනම් අංක 22 දරන, ඊරියගහමුල ලියැද්ද නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. කේ. පෙරේරා විසින් මැන සකස් කළ අංක 1213බී හා 2006.12.16 දින දරන පිඹුරේ "ලොට් ඒ" ලෙස ලකුණු කළ බිම් කට්ටිය වූ උතුරට : නගර සභා කාණුව ද, නැගෙනහිරට : කොළඹ පාර වරිපනම් අංක 20 දරන (කලින් වරිපනම් අංක 142 වූ) පරිශ්‍රය ද, දකුණට : කොළඹ - මහනුවර මහා මාර්ගය දිගට තිබෙන සිමෙන්ති කාණුව (මේසනරි ඩ්‍රේන්) ද, බස්නාහිරට : අංක 1213 බී දරන පිඹුරේ "ලොට් බී" දරන කට්ටිය ද යන මායිම් ඇතුළත පර්චස් එකකුත් දශම නවයයි හයක් (අ. 0, රූ. 0, පර්. 1.96) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ද වේ.

02. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරළයේ, මාවත පත්තුවේ, කෑගල්ල නගරසභා බල ප්‍රදේශය ඇතුළත වෝඩ් අංක 03 දරන නගර සභා කොට්ඨාසයේ වේවැල්දෙණිය ග්‍රාමයේ පිහිටි කොළඹ පාර, වරිපනම් අංක 24 දරන, ඊරියගහමුල ලියැද්ද නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. කේ. පෙරේරා විසින් මැන සකස් කළ අංක 1213බී හා 2006.12.16 දින දරන පිඹුරේ "ලොට් බී" ලෙස ලකුණු කළ බිම් කට්ටිය වූ උතුරට : නගර සභා කාණුව ද, නැගෙනහිරට : අංක 1213 බී දරන පිඹුරේ "ලොට් ඒ" දරන කට්ටිය ද, දකුණට : කොළඹ-මහනුවර මහා මාර්ගය දිගට ඇති සිමෙන්ති කාණුව (මේසනරි ඩ්‍රේන්) ද, බස්නාහිරට : කොළඹ පාර වරිපනම් අංක 28 දරන (කලින් වරිපනම් අංක 152 වූ) පරිශ්‍රය ද යන මායිම් ඇතුළත පර්චස් එකකුත් දශම නවයයි හයක් (අ. 0, රූ. 0. පර්. 1.96) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ද වේ.

**අංක 3873 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල උපදිසාපති කොට්ඨාසය ඇතුළත, මාවත පත්තුවේ, පරණකුරු කෝරළයේ, කොළඹ - මහනුවර පාරේ, කෑගල්ල මහනගර සභා සීමාව ඇතුළත, රදගොල ඇළ ග්‍රාමයේ පිහිටි "වළලියැද්ද නොහොත් තෝලංගමුවගේ ලියැද්ද" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ටී. එන්. ඒ. කාදර් විසින් මැන සකස් කළ අංක 200 හා 1973.02.11 දින දරන පිඹුරේ ලොට් අංක 03 ලෙස දැක්වෙන බෙදා වෙන්කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : ලොට් අංක 1 සහ කාණුව ද, නැගෙනහිරට : ලොට් අංක 4 ද, දකුණට : මහපාර සහ කාණුව ද, බස්නාහිරට : ලොට් අංක 2 ද යන මායිම් ඇතුළත පර්චස් දෙකකුත් දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 2.50) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

**අංක 3869 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල මාවත පත්තුවේ, පරණකුරු කෝරළයේ මාවත පත්තුවේ, කෑගල්ල සුළු නගර සභා සීමාව ඇතුළත, ඔලගම පිහිටි මාලියැද්දේ කුඹුර දැනට වත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු පී. කපුගීකියනගේ විසින් මැන සකස් කළ අංක 2536 හා 1975.07.30 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 3 ලෙස ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 6 සහ සුළු නගර සභා කාණුව ද, නැගෙනහිරට : ලොට් අංක 4 ද, දකුණට : මහ පාර සහ බස්නාහිරට : ලොට් අංක 2 ද යන මායිම් ඇතුළත පර්චස් දෙකකුත් දශම හතයි හයයි හතරක් (අ. 0, රූ. 0, පර්. 2.764) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

01-309/4

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා පිළිබඳ සංශෝධනය

ගනුදෙනුකරුගේ නම : කැරවන් ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.29 වැනි දිනැති අංක 5035/04/2009 දරන රැස්වීම් වාර්තාව යටතේ වෙනත් දේ අතර කැරවන් ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් උකස්කරන ලද දේපළ පරාටේ වෙන්දේසියේ විකිණීමට යෝජනා සම්මත කර ගන්නා ලදී.

එකී දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව් අංක 474හි ආර්. එස්. එම්. ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු රන්ජිත් එස්. මහනාම මහතාට අධිකාරිය සහ බලය පවරන ලද නමුත්, එකී ආර්. එස්. එම්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකරු රන්ජිත් එස්. මහනාම මහතාට එකී වෙන්දේසිය පැවැත්වීමට නොහැකි තත්ත්වයක් උදාවී ඇති බැවින් සහ නොහැකි බැවින් වෙන්දේසිකරුව වෙනස් කිරීමේ අවශ්‍යතාවය උද්ගතවී ඇත.

එහෙයින් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත් :

වෙන්දේසිකරු වන රන්ජිත් එස්. මහනාම මහතාගේ නම ඉවත් කරමින් සහ කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති ආදේශ කරමින් 2009.04.29 වැනි දිනැති යෝජනා සම්මුතිය සංශෝධනය කරමින්, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙසය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
මනෝනීත ආරියනන්ද,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

01-372/9

---

**සෙලාන් බැංකුව පීඑල්සී - අම්බලන්ගොඩ ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0240-01036640-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.13 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. එන්. සී. පී. පෙරේරා විසින් සහතික කරන ලද 2002 මාර්තු මස 08 දිනැති අංක 222 සහ ප්‍රසිද්ධ නොතාරිස් යූ. ජේ. එන්. ජයලත් විසින් සහතික කරන ලද 2003 ජනවාරි මස 08 දිනැති අංක 465 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම හික්කඩුව පදිංචි ඔවන් පණ්ඩිත පරාක්‍රම වික්‍රමසේකර සහ සනත් ප්‍රියන්ත වැන්දබෝනා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දසලක්ෂ දහදහස් දෙසිය තිස්එකයි ශත අසූතුනක (රු. 10,10,231.83) මුදලක්, 2007 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 10,10,231.83 මුදල ද, 2008 ජනවාරි මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර

ගැනීම පිණිස ඉහත කී අංක 222 සහ 465 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

01. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, ඉද්දගොඩ පත්තුවේ බටහිර පස්දුන් කෝරළයේ ඔිවිටිගල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. ඉලංකෝන් විසින් සාදන ලද 1998.02.27, 05 සහ 1998.03.16 සහ 1998.04.02 දිනැති අංක 1704 දරන බෙදුම් සැලැස්මේ සඳහන් කබරගල හෙවත් කබරගලවත්ත ලොට් 4 නමැති ඉඩමේ ලොට් 15 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එස්. පී. ඉලංකෝන් විසින් සාදන ලද 1984 ජූනි මස 14 සහ 19 දිනැති අංක 538 දරන සැලැස්මේ ලොට් ඒ සහ සී වල එකතු කිරීමක් වන) ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට්ස් 13, 14 සහ 12 ද, නැගෙනහිරට : මහවෙල අස්වැද්දුම ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 3 ද සහ බස්නාහිරට : ලොට් 16 සහ 11 ද යන මායිම් තුළ රූඩ් දෙකයි, පර්චස් පහයි දශම එකයි දෙකක් (අ. 0, රූ. 2, පර්. 5.12) ක් විශාල බිම, ගස් සහ වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී339/134හි ලියාපදිංචි කර ඇත.

පහත සවිස්තරව විස්තර කරනු ලබන ඉඩම් උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග :

02. පෙර කී ඉද්දගොඩ පත්තුවේ ඔිවිටිගල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. ඉලංකෝන් විසින් සාදන ලද 1998.02.27, 05 සහ 1998.03.16 සහ 1998.04.02 දිනැති අංක 1704 දරන බෙදුම් සැලැස්මේ සඳහන් කබරගල හෙවත් කබරගලවත්ත ලොට් 4 නමැති ඉඩමේ ලොට් 11 ලකුණු කළ (අඩි 15ක් පළල) (බලයලත් මිනින්දෝරු එස්. පී. ඉලංකෝන් විසින් සාදන ලද 1984 ජූනි මස 14 සහ 19 දිනැති අංක 538 දරන සැලැස්මේ ලොට් ඒ සහ සී වල එකතු කිරීමක් වන) ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට්ස් 2, 3, 4, 7, 8, 9 සහ 10 ද, නැගෙනහිරට : කනත්තගොඩ සිට මතුගමට යන පාර-හොරවල මහා මාර්ගය, විෂය වස්තුවෙන් අයින්කරන ලද ලොට් බී සහ ලොට් 12, 13 සහ 15 ද, දකුණට : ලොට් 12, 16, 17, 18 සහ 19 ද සහ බස්නාහිරට : ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් තිස් දෙකයි දශම පහයි අටක් (අ. 0, රූ. 0, පර්. 32.58)ක් විශාල ඉඩම. මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී 339/130 හි ලියාපදිංචි කර ඇත.

03. පෙර කී ඉද්දගොඩ පත්තුවේ, ඔිවිටිගල පිහිටි බලයලත් මිනින්දෝරු එස් පී. ඉලංකෝන් විසින් සාදන ලද 1998.02.27, 05 සහ 1998.03.16 සහ 1998.04.02 දිනැති අංක 1704 දරන බෙදුම් සැලැස්මේ සඳහන් කබරගල හෙවත් කබරගලවත්ත ලොට් 4 නමැති ඉඩමේ ලොට් 13 ලකුණු කළ (අඩි 4ක් පළල) (බලයලත් මිනින්දෝරු එස්. පී. ඉලංකෝන් විසින් සාදන ලද 1984 ජූනි මස 14 සහ 19 දිනැති අංක 538 දරන සැලැස්මේ ලොට් ඒ සහ සී වල එකතුකිරීමක් වන) ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 12 ද, නැගෙනහිරට : ලොට් 14 ද, දකුණට : ලොට් 15 සහ බස්නාහිරට : ලොට් 11 ද යන මායිම් තුළ පර්චස් හතලිස් නවය (අ. 0, රූ. 0, පර්. 49)ක් විශාල ඉඩම. මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී 339/132හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

01-369

---

## ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 24250 හා 24251 සහ 2006.09.21 දින දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ සහ ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 42380 දරන්නාවූ ද, ලියාපදිංචි කාර්යාලය සීදූවේ පිහිටා ඇත්තා වූ ද (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරන) සමාගමක් වන බ්‍රිලියන්ට් වොෂිං (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම විසින් සහ සීදූවේ පදිංචි කිත්තම්පහු කෝරලලාගේ හද්‍රා රම්‍යශීලි සහ සීදූවේ පදිංචි කිරිවත්තුඩුවගේ දොන් සුනිල් අමරතුංග යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 අගෝස්තු මස 31 වැනි දිනට ඉහත කී අංක 24250 හා 24251 දරන උකස් බැඳුම්කර මත එකී බ්‍රිලියන්ට් වොෂිං (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් සහ ඉහත කී කිත්තම්පහු කෝරලලාගේ හද්‍රා රම්‍යශීලි සහ කිරිවත්තුඩුවගේ දොන් සුනිල් අමරතුංග යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හැත්තෑහය ලක්ෂ විසිදහස් තුන්සිය පහළොවකුත් ශත හැත්ත හතරක (රු. 76,20,315.74) මුදලක් සහ 2009 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටනවලක්ෂ හතලිස් දෙදහස් හයසිය හැට අටක් (රු. 69,42,668) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හැත්තෑහය ලක්ෂ විසිදහස් තුන්සිය පහළොවකුත් ශත හැත්තෑ හතරක (රු. 76,20,315.74) මුදල සහ 2009 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටනවලක්ෂ හතලිස් දෙදහස් හයසිය හැට අටක් (රු. 69,42,668) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 24250 හා 24251 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි ඇති චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් හා සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 24250 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, කටුනායක-සීදූව නගර සභා සීමාව ඇතුළත ලියනගෙමුල්ලේ පිහිටි, දුවටගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සකස් කළ අංක 3120 හා 1993.07.28 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 01 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ, ලියනගෙමුල්ල, පල්ලිය පාර, වරිපනම් අංක 21 දරන එකී ලොට් අංක 01 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : එම්. එම්. ඩී. ජේ. පෙරේරාට අයිති ඉඩම ද, නැගෙනහිරට : ලොට් අංක 2 ද, දකුණට : පල්ලිය පාර ද, බස්නාහිරට : ග්‍රාමෝදය මාවත ද යන මායිම් ඇතුළත පර්චස් තිස් නවයකුත් දශම හයයි අටක් (අ. 0, රූ. 0, පර්. 39.68) *නොහොත්* හෙක්ටෙයාර් 0.10036ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ වෙනත් සියලු දේ.

### අංක 24251 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

මෙහි පහත දැක්වෙන චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ ඇතුළුව එනම් :

| | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 1. | 450 Lbs මැෂින් | 02 |
| 2. | 200 Lbs ඩ්‍රයර් | 03 |
| 3. | හයිඩ්‍රෝ මැෂින් | 02 |
| 4. | සාම්පල් මැෂින් | 01 |
| 5. | 100 Lbs ටම්බල් ඩ්‍රයර් | 05 |
| 6. | 450 Lbs ඉන්ඩස්ට්‍රියල් වොෂර් | 02 |
| 7. | අඟල් 36 හයිඩ්‍රෝ එක්ස්කැවේටර් | 01 |
| 8. | ක්ලීවර් බෲක්ස් ස්ටීම් බොයිලර් | 01 |
| 9. | කන්ඩෙන්සර් ටැන්ක් | 01 |
| 10. | ෆර්නස් ඔයිල් ටැන්ක් | 01 |
| 11. | චිමිනි | 01 |
| 12. | වෝටර් සිෆ්ටිං යුනිට් | 01 |

ඇතුළුව, සීදුව, මූකලන්ගමුව, මුණිදාස කුමාරතුංග මාවත, අංක 364/ඒ දරන පරිශ්‍රය තුළ සහ මත දැනට තිබෙන අමතර කොටස්, උපාංග සහ මෙවලම් හෝ වෙනත් ඕනෑම ගුදමක තිබිය හැකි මෙවලම් උපකරණ යන්ත්‍රසූත්‍ර හා පිරියත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

01-309/2

---

## ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. රාජරත්න විසින් ලියා සහතික කරන ලද අංක 304 හා 2004 ජූලි මස 01 දින ද, මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. හපුතන්ත්‍රී ලියා සහතික කළ අංක 454 හා 2007 අගෝස්තු මස 01 දින ද දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, ගම්පොළ, ධර්ශනී දීපිකා කුමාරි සමරතුංග *නොහොත්* ජයසුන්දර ඒකනායක පණ්ඩිත බ්‍රාහ්මණ සමරතුංග මුදියන්සේලාගේ ධර්ශනී දීපිකා කුමාරි සමරතුංග යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 අගෝස්තු මස 31 වැනි දිනට ඉහත කී ධර්ශනී දීපිකා කුමාරි සමරතුංග *නොහොත්* ජයසුන්දර ඒකනායක පණ්ඩිත බ්‍රාහ්මණ සමරතුංග මුදියන්සේලාගේ ධර්ශනී දීපිකා කුමාරි සමරතුංග යන අයගෙන් එකී අංක 304 හා 454 දරන උකස් බැඳුම්කර මත ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් විසිහතරලක්ෂ විසිඅටදහස් දෙසීය පනස් දෙකකුත් ශත අසූ හයක (රු. 24,28,252.86) මුදලක් සහ 2009 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිලක්ෂ විසිපන්දහස් හත්සිය හතක් (රු. 20,25,707) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතියකට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් විසිහතරලක්ෂ විසිඅටදහස් දෙසීය පනස් දෙකකුත් ශත අසූ හයක (රු. 24,28,252.86) මුදල සහ 2009 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිලක්ෂ විසිපන්දහස් හත්සිය හතක් (රු. 20,25,707) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 304 හා 454 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 304 සහ 454 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත ගඟ පහළ කෝරළයේ ගම්පොල නගර සභා සීමාව ඇතුළත, මලබාර් වීදියේ පිහිටි බලයලත් මිනින්දෝරු බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් මැන සකස් කළ අංක 1115 හා 1986.12.23 දින දරන පිඹුරේ දැක්වෙන මලබාර් වීදිය වරිපනම් අංක 18 දරන බිම් කට්ටිය වන පර්චස් විසිනවයකුත් දශම අටයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 29.82) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටියට මායිම්, උතුරට සහ උතුරු-නැගෙනහිරට : වරිපනම් අංක 20 දරන පරිශ්‍රය ද, දකුණට සහ දකුණු-නැගෙනහිරට : වරිපනම් අංක 16 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : දකුණු-බස්නාහිරට සහ දකුණු-නැගෙනහිරට : රේල්වේ රිසවේසම ද, යන මායිම් ඇතුළත පිහිටි ඉඩමේ බිම, ගසකොළ, වැවිලි සහ වරිපනම් අංක 18 දරන පරිශ්‍රය හා එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මෑතක දී කරන ලද මැනීමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත, ගඟ පහළ කෝරළයේ ගම්පොල නගර සභා සීමාව ඇතුළත, අංක 5 බසාර් නගර සභා කොට්ඨාසයේ, කවීශ්වර මාවතේ පිහිටි බලයලත් මිනින්දෝරු බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් මැන සකස් කළ අංක 1115 හා 1986.12.23 දින දරන පිඹුරේ කවීශ්වර මාවත වරිපනම් අංක 18 දරන ඉඩමට හා පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු පී. ආර්. ටී. බී. රත්නායක විසින් මැන සාදන ලද අංක 3219 හා 2004.03.08 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ, කවීශ්වර මාවත (කලින් මලබාර් වීදිය) වරිපනම් අංක 18 දරන පරිශ්‍රය වූ, පර්චස් විසිනමයකුත් දශම අටයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 29.82) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමට මායිම්, උතුරට සහ උතුරු-නැගෙනහිරට : කවීශ්වර මාවත වරිපනම් අංක 20 දරන පරිශ්‍රය ද, දකුණු-නැගෙනහිරට : රේල්වේ රිසවේසම ද, දකුණට සහ දකුණු-බස්නාහිරට : කවීශ්වර මාවත වරිපනම් අංක 16 දරන පරිශ්‍රය ද, උතුරු-බස්නාහිරට : කවීශ්වර මාවත ද යන මායිම් ඇතුළත පිහිටි ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

01-308/1

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 234282.
ගිණුම් අංකය : 1970002472.
රාජපක්ෂ මනිමෙල් නම්බි මහිල් අනුරලාල්.

2009 මාර්තු මස 24 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඕ. ඒ. ද සිල්වා විසින් 2005 අප්‍රේල් මස 02 වැනි දින සහතික කරන ලද අංක 1410 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රාජපක්ෂ මනිමෙල් නම්බි මහිල් අනුරලාල් ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දාහත් ලක්ෂ විසිනව දහස් නවසිය දාහතයි ශත හැට හයක (රු. 17,29,917.66) මුදලක් 2009 ජනවාරි මස 21 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දාහත් ලක්ෂ විසිනව දහස් නවසිය දාහතයි ශත හැට හයක (රු. 17,29,917.66) මුදලට 2009 ජනවාරි මස 22 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 15,83,375ක මුදල මත 6%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 1410 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

(1) බලයලත් මානක සී. ටී. ද එස්. මනුකුලසූරිය විසින් 1998 නොවැම්බර් මස 18 වැනි දින සාදන ලද අංක 1559 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ අම්බලන්ගොඩ, කෙරමිනිය පිහිටි පුංචි මැණිකා පදිංචි වෙලබොඩවත්ත කියන ඉඩමේ පිහිටි සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ඒකාබද්ධ ලොට් 8බී සහ 9යේ ලොට් සී දරන කොටසේ ලොට් සී1 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් ඒ1 ද, නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස වන ලොට් සී ද, දකුණට : එම ඉඩමේ ලොට් බී ද සහ බස්නාහිරට : වටුගෙදර සිට පොල්වත්ත දක්වා ඇති මහා මාර්ගය ද, යන මායිම් තුළ අංක 1559 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි පර්චස් නවයයි දශම නවයයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 9.92) විශාල ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ29/129 සහ ඒ29/128 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

(2) බලයලත් මානක සී. ටී. ද එස්. මනුකුලසූරිය විසින් 1998 නොවැම්බර් මස 18 වැනි දින සාදන ලද අංක 1559 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ අම්බලන්ගොඩ, කෙරමිනිය පිහිටි පුංචි මැණිකා පදිංචි වෙලබොඩවත්ත කියන ඉඩමේ පිහිටි සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ඒකාබද්ධ ලොට් 8බී සහ 9යේ ලොට් ඒ දරන කොටසේ ලොට් ඒ1 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් ඒ දරන කොටසේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් සී ද, දකුණට : එම ඉඩමේ ලොට් සී දරන කොටසේ ලොට් සී1 ද බස්නාහිරට : පාර ද යන මායිම් තුළ අංක 1559 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි පර්චස් බිංදුවයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 0, පර්. 0.08) විශාල ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 196/84 සහ ඒ196/85 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචි වී ඇත.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

01-352

---

## සෙලාන් බැංකුව පීඑල්සී - කුලියාපිටිය ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 නොවැම්බර් මස 13 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0440-01985050-100.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1998 සැප්තැම්බර් 04 දිනැති අංක 1099, ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. ද ලිවේරා විසින් සහතික කරන ලද 1999 මාර්තු 05 දිනැති අංක 3677 සහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද 2004 දෙසැම්බර් 21 දිනැති අංක 3418 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, නිකවැරටිය පදිංචි වනසිංහ ආරච්චිගේ ලලිත් වනසිංහ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් අටලක්ෂ හයදහස් දෙසිය අනූහයයි ශත විසිතුනක (රු. 8,06,296.23) මුදලක්, 2009 ජූනි 15 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 8,06,296.23 මුදල ද, 2009 ජූනි 16 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1099, 3677 සහ 3418 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උගස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ (නිකවැරටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැදගන්දහය කෝරළයේ නැගෙනහිර වන්නි හත්පත්තුවේ දලුපොතගම පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. බී. ජී. බණ්ඩාර විසින් සාදන ලද 1995 සැප්තැම්බර් 26 දිනැති අංක 847 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කලුවරගහමුලයාය නමැති, ඉඩමේ ලොට් 1 ලකුණු කළ (අංක 2915 දරන ග්‍රාම සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 100 සහ ලොට් 101 කේ එකතු කිරීමක අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම කොටසට මායිම්, උතුරට : අංක 2915 දරන එෆ්. වී. සැලැස්මේ ලොට් 90 සහ 102 ද, නැගෙනහිරට : අංක 2915 දරන එෆ්. වී. සැලැස්මේ ලොට් 102 සහ මහා මාර්ගය ද, දකුණට : මහා මාර්ගය සහ අංක 847 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද සහ බස්නාහිරට : අංක 847 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද යන මායිම් තුළ එකී අංක 847 දරන සැලැස්ම අනුව රූඩ් එකයි, පර්චස් පහයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 5.5) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සී 25/135 යටතේ සහ කාණ්ඩය/පත්ඉරුව සී 25/193 හි ද ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

01-370

---

## ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 22464 හා 2005.02.22 දින දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම්, "දුල්මි එන්ටප්‍රයිසස්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ වේයන්ගොඩ ව්‍යාපාරය කරගෙන යන, වේයන්ගොඩ, මාරසිංහ ආරච්චිලාගේ මංජුල සනීර හේමචන්ද්‍ර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009

සැප්තැම්බර් 29 වැනි දිනට, ඉහත කී අංක 22464 දරන උකස් බැඳුම්කරය මත එකී මාරසිංහ ආරච්චිලාගේ මංජුල සනීර හේමචන්ද්‍ර යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් පන්ලක්ෂ හතළිස් එක් දහස් හාරසිය විසි දෙකකුත් ශත හතරක (රු. 541,422.04) මුදලක් සහ 2009 සැප්තැම්බර් 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්ලක්ෂ හතළිස් පන්දහස් පන්සිය තිස් හතරකුත් ශත විසි හතක් (රු. 345,534.27) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1, ඔක්තෝබර් 1, දිනයෙන් ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් පන්ලක්ෂ හතළිස් එක් දහස් හාරසිය විසි දෙකකුත් ශත හතරක (රු. 541,422.04) මුදල සහ 2009 සැප්තැම්බර් 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්ලක්ෂ හතළිස් පන් දහස් පන්සිය තිස් හතරකුත් ශත විසි හතක් (රු. 345,534.27) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1, ඔක්තෝබර් 1, දිනයෙන් ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 22464 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළොන්නාවේ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 22464 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, පත්තලගෙදර ග්‍රාමයේ පිහිටි "මීග්‍රෝව් වතුයාය" යනුවෙන් නොහොත් "පාම්ග්‍රෝව් එස්ටේට්" යනුවෙන් හැඳින්වුනු දැනට "ෆිනෑන්ස් කොම්පැණි එස්ටේට්" යනුවෙන් හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ඩී. ජී. එම්. පීටර් ප්‍රනාන්දු මැන සකස් කළ අංක 2084 හා 1987.01.28 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන්කල බිම් කට්ටිය වන එකී ලොට් අංක 1 දරන බිම් කට්ටියට මායිම් උතුරට : අංක 2116 දරන (අඩි 30ක් පළල පාරවල් සඳහා වෙන් කළ) ලොට් "ආර් 1" සහ "ආර් 2" ද නැගෙනහිරට : ලොට් අංක 2 ද දකුණට : (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කළ) ලොට් අංක 13 ද, බස්නාහිරට : (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කළ) ලොට් අංක 13 ද, යන මායිම් ඇතුළත පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්. 18) නොහොත් හෙක්ටයාර් 0.0455ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගසකොළ, වැව්ලි සහ වෙනත් සියලු දේ.

මෙයට අංක 2116 පිඹුරේ "ආර් 1" සහ "ආර් 2" ලෙස ලකුණු කළ පාරවල් සඳහා වෙන් කළ බිම් කොටස් සහ අංක 2084 දරන පිඹුරේ ලොට් අංක 13 හා 38 ලෙස දැක්වෙන පාරවල් සඳහා වෙන් කළ බිම් කොටස් ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසිකම ද ඇතුළත් ය.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරි.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.
01-309/5

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 24892 සහ 2007.04.24 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, "ගම්පහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් කොම්පනි" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ගම්පහ ව්‍යාපාරය කරගෙන යන දෙදෙනාම ගම්පහ පදිංචි, හපුගොඩ ආරච්චිගේ දොන් රොෂාන් චමින්ද ජයවර්ධන සහ ඉරිප්පුගේ තුෂාර දීපාල් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 අගෝස්තු 31 වැනි දිනට, ඉහත කී අංක 24892 දරන උකස් බැඳුම්කරය මත, එකී හපුගොඩ ආරච්චිගේ දොන් රොෂාන් චමින්ද ජයවර්ධන සහ ඉරිප්පුගේ තුෂාර දීපාල් යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දහනවලක්ෂ පනස්නවදහස් නවසිය අනූතුනකුත් ශත තිස්තුනක (රු. 19,59,993.33) ක මුදලක් සහ 2009 සැප්තැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහසයලක්ෂ හැටහයදහස් හයසිය හැටක් (රු. 16,66,660.33) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් 01 යන දිනවලින් ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දහනවලක්ෂ පනස්නවදහස් නවසිය අනූතුනකුත් ශත තිස්තුනක (රු. 19,59,999.33) මුදලක් සහ 2009 සැප්තැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහසයලක්ෂ හැටහය දහස් හයසිය හැටක් (රු. 16,66,660) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි 01, අප්‍රියෙල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් 01 යන දිනවලින් ආරම්භව ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එහි උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 24892 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 24892 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ, උඩුගම්පොළ උපකාර්යාල බල ප්‍රදේශ සීමාව ඇතුළත උඩුගම්පොළ පිහිටි, කොස්ගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එච්. ඒ. එන්. පී. රණසිංහ විසින් මැන සකස් කරන ලද අංක 1279 හා 2007.01.24 දින දරන පිඹුරේ "ලොට් ඒ" ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : බී. ඩී. ඩේවිඩ් ට සහ බී. ඩී. සෝමපාලට අයිති ඉඩම ද, දකුණට : බී. ඩී. සෝමාවතීගේ උරුමකරුවන්ට අයිති ඉඩම ද බස්නාහිරට ප්‍රාදේශීය සභා පාර ද යන මායිම් ඇතුළත, ඉහත කී අංක 1279 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් එකොළහකුත් දශම හයයි හතක් (අ. 0, රූ. 1, පර්. 11.67) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරි.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.
01-309/3

---

පීවී 62278.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "සුප්‍රීම් ඇක්වාරියම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.12.05 දින සංස්ථාපිත සමාගමක් වන සුප්‍රීම් ඇක්වාරියම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, සුප්‍රීම් ඇක්වාරියම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
01-253

---

පීවී 61978.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "එයාර්ලයින් ට්‍රේඩර්ස් (පීවීටී) එල්ටීඩී" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.11.14 දින සංස්ථාපිත සමාගමක් වන එයාර්ලයින් ට්‍රේඩර්ස් (පීවීටී) එල්ටීඩී ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, එයාර්ලයින් ට්‍රේඩර්ස් (පීවීටී) එල්ටීඩී නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
01-252

මුද්‍රණය හා බෙදාහැරීම සීමාසහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
# Sri Lanka Institute of Printing

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය

(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

## කොළඹ, මාතලේ සහ බේරුවල ශාඛා - පරිගණක පාඨමාලාව 2010

### පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course in Desktop Publishing & Typesetting

**COURSE CONTENT**

- Introduction to Computers
- Microsoft Word
- Adobe Page Maker
- Quark Xpress
- Adobe Indesign
- Scanning Techniques

| | |
|---|---|
| කාලසීමාව | - පැය 144 |
| මාධ්‍යය | - සිංහල |
| ඇතුලත්වීමේ සුදුසුකම් | - අ.පො.ස(සා-පෙළ) |
| කණ්ඩායම් පන්ති | - එක් කණ්ඩායමකට සිසුන් 05 බැගින් |
| පැවැත්වෙන දිනයන් | - සතියේ දින |

මෙම පාඨමාලාව තුළින් පරිගණකය ආධාරයෙන් අකුරු ඇමිණීම පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදෙන අතර මුල සිටම පරිගණකය පිළිබඳ දැනුමත් සිත්තම්, රූ රටා නිර්මාණය (Graphic Design) පිළිබඳ අවශ්‍ය මූලික දැනුමත් ලබාදේ.

### මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව Certificate Course in Microsoft Office

**COURSE CONTENT**

- Introduction to Computers
- Microsoft Word
- Microsoft Excel
- Microsoft Power Point
- Microsoft Access
- Introduction to Internet & E-mail

| | |
|---|---|
| කාලසීමාව | - පැය 48 |
| මාධ්‍යය | - සිංහල |
| ඇතුලත්වීමේ සුදුසුකම් | - අ.පො.ස(සා-පෙළ) |
| කණ්ඩායම් පන්ති | - එක් කණ්ඩායමකට සිසුන් 05 බැගින් |
| පැවැත්වෙන දිනයන් | - සතියේ දින |

මේ තුළින් මයික්‍රොසොෆ්ට් පාඨමාලාව පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා දෙන අතර පරිගණක පිළිබඳ මූලික දැනුම හා අවබෝධය ද ලබාදේ.

### පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course in Graphic Designing

**COURSE CONTENT**

- Introduction to Graphics
- Introduction to Adobe Indesign
- Macromedia FreeHand
- CorelDraw
- Adobe Illustrator
- Adobe Photoshop
- Color theory
- Scanning Technology

| | |
|---|---|
| කාලසීමාව | - පැය 114 |
| මාධ්‍යය | - සිංහල/ඉංග්‍රීසි |
| ඇතුලත්වීමේ සුදුසුකම් | - අ.පො.ස (සා-පෙළ) සහ පරිගණක භාවිතය පිළිද දැනීම |
| කණ්ඩායම් පන්ති | - එක් කණ්ඩායමකට සිසුන් 05 බැගින් |
| පැවැත්වෙන දිනයන් | - සතියේ දින සහ සති අන්ත |

මෙම පාඨමාලාව තුළින් පරිගණක සිත්තම් නිර්මාණය පිළිබඳ පූර්ණ දැනුමක් හා අවබෝධයක් ලබාදේ. අද ග්‍රැෆික්ස් නිර්මාණයට අදාල අත්‍යවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල්ව මෙහිදී සාකච්ඡා කරනු ලැබේ. සිත්තම් නිර්මාණකරුවන්, මුද්‍රණ කරුවන්, ප්‍රචාරක සහ දැන්වීම් ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම මේ පිළිබඳ උනන්දුවක් දක්වන සියලු දෙනාට සරිලන අයුරින් මෙම පාඨමාලාව නිර්මාණය කර ඇත.

### වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව Certificate Course in Web Designing

**COURSE CONTENT**

- Introduction to Internet
- Introduction to Operating Systems & Networking
- HTML/Macromedia DreamWever
- Macromedia FireWorks
- Using Graphics in Web Page
- Introduction to 2D & 3D Animation
- Macromedia Flash/Multimedia for Web
- Technologies Using in the Web

| | |
|---|---|
| කාලසීමාව | - පැය 60 |
| මාධ්‍යය | - සිංහල/ඉංග්‍රීසි |
| ඇතුලත්වීමේ සුදුසුකම් | - අ.පො.ස(සා-පෙළ) පරිගණක භාවිතය පිළිබඳ දැනුම |
| කණ්ඩායම් පන්ති | - එක් කණ්ඩායමකට සිසුන් 05 බැගින් |
| පැවැත්වෙන දිනයන් | - සතියේ දින සහ සති අන්ත |

මෙම පාඨමාලාව තුළින් අද දියුණුවන ලෝකය පුරා සන්නිවේදනය සිදුවන ඊමේල්, ඉන්ටනෙට් ඇතුළත්ව වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා දේ. මෙම පාඨමාලාව පොදුවේ මෙම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන සියලු දෙනාටම ඉතාමත් වැදගත් වේ.

1984 වර්ෂයේ පාර්ලිමේන්තු පණතකින් තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ස්ථාපිත කර තිබෙන අතර මුද්‍රණ ග්‍රැෆික්ස් සහ බහුමාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ දැනුම සහ කුසලතාවය පුලුල් කිරීමේ කාර්යභාරයේ නියැලී සිටියි. මෙම ආයතනයේ පාඨමාලාවන් මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ආකාරයෙන් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුලත් වීමට බලාපොරොත්තු වන නවකයන්ට මෙන්ම පාසැල් හැරගිය සිසුන්ටද විශේෂයෙන් වැදගත් වේ. මෙම ආයතනයේ කොළඹ, බේරුවල හා මාතලේ ශාඛාවල ඉහත සඳහන් පාඨමාලා ජනවාරි/පෙබරවාරි මස ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

**ප්‍රධාන කාර්යාලය**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දු.ක: 0112686162, 0112679791
ෆැක්ස්: 0112686162 ඊ-මේල්- sliopreg@sltnet.lk

**බේරුවල ශාඛාව**

උපදේශක
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
දු.ක. 0342279881
0714286261
ඊ-මේල් :
sliopberuwala@yahoo.com

**මාතලේ ශාඛාව**

උපදේශක
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
දු.ක. 0662222172
0714895044
ඊ-මේල් :
sliopsaman@yahoo.com